සැ. යු.-2015.09.11 දින පළවූ අංක 1932 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,933 - 2015 සැප්තැම්බර් මස 18 වැනි සිකුරාදා - 2015.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1568 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1579 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ඔක්තෝබර් මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 සැප්තැම්බර් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1565- B 80984—5,352 (2015/09)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### දේශීය ආදයම් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්‍ෂණික නොවන ඛණ්ඩ 02 සේවා ගණයට අයත් කාර්යාල පිවිසුම් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

දේශීය ආදයම් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති තාක්‍ෂණික නොවන -ඛණ්ඩ 02 සේවා ගණයේ III ශ්‍රේණියේ කාර්යාල පිවිසුම් නිලධාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් දේශීය ආදයම් කොමසාරිස් ජනරාල්, දේශීය ආදයම් දෙපාර්තමේන්තුව, අංක 155, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''කාර්යාල පිවිසුම් නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2015'' යනුවෙන් සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2015.10.19 වැනි දිනට හෝ එදිනට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ඇත. තව ද, දේශීය ආදයම් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. පුරප්පාඩු සංඛ්‍යාව හා පුරප්පාඩු පිරවීම :
පුරප්පාඩු වී ඇති කාර්යාල පිවිසුම් නිලධාරි තනතුරු ගණන එකකි.

04. වැටුප් පරිමාණය :
තනතුරට අදළ වැටුප් ක්‍රමය : රු. 13,120-10x145-11x170-10x240-10x320-රු. 22,040 (MN1-2006A)

05. සුදුසුකම් :

(1) අධ්‍යාපන සුදුසුකම් :

(1) සිංහල/දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්‍ෂණය හැර) සමත්ව තිබීම.

(2) වෘත්තීය සුදුසුකම් :

(1) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් යතුරු ලියනය හා මූලික පරිගණක දැනුම පිළිබඳ පාඨමාලාවක් හදරා තිබීම.

(2) ඉංග්‍රීසි හා සිංහල භාෂාවෙන් චතුර ලෙස කථා කිරීමේ හැකියාව තිබිය යුතුය. දෙමළ භාෂාව අයදුම්කරුගේ මාධ්‍ය භාෂාව නොවන්නේ නම්, ඒ පිළිබඳව ව්‍යවහාර දැනුමක් තිබිය විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(3) පළපුරුද්ද .—අදාළ ක්ෂේත්‍රයේ වසර 02කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

(4) *කායික සුදුසුකම්.*—සෑම අපේක්‍ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(5) වෙනත් සුදුසුකම් : (i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

*වයස* .— අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 (දහඅට)ට නොඅඩු අවුරුදු 30 (තිහ)ට නොවැඩි විය යුතුයි.

(6) බඳවා ගැනීමේ ක්‍රමය :

අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා දේශීය ආදයම් කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්‍ෂණ මණ්ඩලයක් මගින් තනතුර සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක් පවත්වනු ලබන අතර, එම පරීක්‍ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල මත පවත්නා පුරප්පාඩු අනුව කාර්යාල පිවිසුම් නිලධාරි තනතුරට අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

(7) ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය

| *පරීක්‍ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| | |
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 25 |
| අතිරේක පළපුරුද්ද | 25 |
| භාෂා හැකියාව | 15 |
| පරිගණක හා තොරතුරු තාක්‍ෂණය පිළිබඳ හැකියාව | 10 |
| සම්මුඛ පරීක්‍ෂණයේ දී දක්වනු ලබන කුසලතාව | 05 |
| | |
| එකතුව | 100 |

(8) ව්‍යාජ තොරතුරු සැපයීම :

ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිර්ව්‍යාජ තොරතුරු සැපයිය යුතු ය. සාවද්‍ය තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් පරීක්‍ෂණයට පෙර හෝ පරීක්‍ෂණය පැවැත්වෙද්දී හෝ පරීක්‍ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක පත්වීම් බලධරයා විසින් ඔහුගේ/ඇයගේ අපේක්‍ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පුළුවන.

(9) පත්වීමේ කොන්දේසි :

මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක මුදල් ගෙවිය යුතුය.

10. සේවා කොන්දේසි :

(අ) පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වනු ඇත.
(ආ) පත්වීම ලැබ වසර 03ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.
(ඇ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරනු ලබන පොදු කොන්දේසි වලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක PSC/EST/3/1/2/3/2013 හා 2014.08.14 දිනැතිව අනුමත කරන ලද කාර්යාල පිවිසුම් නිලධාරි බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධානයන්ට ද ඊට මින් මතු කරනු ලබන සංශෝධනයන්ට ද යටත්ව කාර්යාල පිවිසුම් නිලධාරී තනතුරට පත්වීම් ලබා දෙනු ලැබේ.

11. තෝරා ගැනීමේ පටිපාටිය :
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පවත්නා පුරප්පාඩු අනුව බඳවා ගනු ලැබේ.

12. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2014.01.21 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව, සේවයට බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබා ගත යුතුය.

13. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(අ) ඉල්ලුම්පත සැකසීම :
මෙම නිවේදනයට අමුණා ඇති ඉල්ලුම්පත ආකෘතියට අනුව ඉල්ලුම්පත සැකසිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වේ. සාමාන්‍ය ෆොටෝ කොපි (21 x 29cm /8.5" x 12"/A4) කඩදසියෙහි දෙපැත්තෙම භාවිතා කරමින් අයදුම්පත සකස් කළ යුතුය.

(ආ) අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු. 2,40,360 ක් හෝ ඊට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය. රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් ආයතන ප්‍රධානියා විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

14. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව දේශීය ආදයම් කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියළු අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු නීති රීති සහ මෙම නිවේදනයේ අඩංගු කොන්දේසි අනුව කටයුතු කිරීමට බැඳී සිටී.

සටහන.-සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

කල්‍යාණි දහනායක,
දේශීය ආදයම් කොමසාරිස් ජනරාල්.

2015.08.31 දින,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේදී ය.

### ආදර්ශ අයදුම්පත්‍රය

***දේශීය ආදයම් දෙපාර්තමේන්තුවේ කාර්යාල පිවිසුම් නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2015***

01. (අ) මුලකුරු අගට යොද මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උද.* (GUNAWARDHANA. M. G. B.S. K.)

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. (අ) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
(ආ) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ඇ) ස්ථිර ලිපිනය අදළ පොලිස් ස්ථානය :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐

ස්ත්‍රී - 1, පුරුෂ - 0 (අදළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

05. විවාහක/අවිවාහක බව : ☐
අවිවාහක - 1 (අදළ අංකය කොටුව තුළ ලියන්න)
විවාහක - 2

06. උපන් දිනය ඃ

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

07. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ (2015.10.19)

අවුරුදු | | | මාස | | | දින | | |

08. පුරවැසි භාවය (පරම්පරාවෙන් ද/ලියාපදිංචි කිරීමෙන් ද යන වග) :————.

09. දුරකථන අංකය ඃ | | | | | | | | | | |

10. අධ්‍යාපන සුදුසුකම් ඃ

අ. පො. ස. (සා. පෙළ.)

(i) විභාගයේ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාග ප්‍රතිඵල :

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ. පො. ස. (උ. පෙළ)

(i) විභාගයේ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාග ප්‍රතිඵල ඃ

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |

11. වෘත්තීය සුදුසුකම් :————.

12. පළපුරුද්ද :————.

13. ඔබ රජයේ සේවයේ තනතුරකින් විනයානුකූල හේතූන් මත පහකිරීමක් හෝ කිසියම් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියේ වරදකරු වී ඇත්නම් හෝ ඒ හා සම්බන්ධ සියළුම විස්තර :————.

14. අයදුම්කරුගේ සහතිකය ඃ

(i) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ නිවැරදි ලෙස සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ප්‍රකාශ කරමි.

(ii) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමටත් යටත් වන බව මම දනිමි.

(iii) අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීම් නිවේදනයේ සියළු කරුණු ඉතා හොඳින් කියවා අවබෝධ කරගත් බවත්, එහි සඳහන් සියළු කරුණු හා කොන්දේසිවලට එකඟ වන බවත් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

(නිල මුද්‍රාවෙන් සහතික කරන්න)

16. දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානියාගේ සහතිකය :

...................................මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවයේ නියුතු බව ද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදයක බව ද, මෙම තනතුරට අදළ නිවේදනයේ පරිදි මෙම තනතුරට අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති බව ද, ඔහු/ඇය තනතුර සඳහා තෝරාගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද ප්‍රකාශ කරමි.

(අදළ නොවන වචන කපා හරින්න.)

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සහතික කරන්න.)

09-304/1

---

**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණය (PL2-2006)

**වඩු කාර්මික තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ වඩු කාර්මික තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති පිරිමි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙහි සඳහන් ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, අංක 155, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''වඩු කාර්මික තනතුරට බඳවා ගැනීම - 2015'' යනුවෙන් සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2015.10.19 වැනි දිනට හෝ එදිනට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. පුරප්පාඩු සංඛ්‍යාව හා පුරප්පාඩු පිරවීම.
පුරප්පාඩු වී ඇති වඩු කාර්මික තනතුරු ගණන එකකි.

04. වැටුප් පරිමාණය :

තනතුරට අදළ වැටුප් ක්‍රමය : රු. 12,210-10x130-10x145-10x160-12x170-රු. 18,600 (PL2-2006A)

05. සුදුසුකම් :

5.1 අධ්‍යාපන සුදුසුකම්:

(1) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙන් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

5.2 වෘත්තීය සුදුසුකම් :

5.2.1 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි වඩු කාර්මික වෘත්තියට අදාළ ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ පූර්ණකාලීන පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

5.2.2 පළපුරුද්ද : සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ පිළිගත් ආයතනයක වඩු කාර්මික තනතුර පිළිබඳ වසර 03 කට නොඅඩු වෘත්තීය පළපුරුද්දක් තිබිය යුතු ය.

5.3 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

5.4 වෙනත් සුදුසුකම් :

I ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

II අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

III තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

IV අයදුම් කිරීමට සුදුසුකම් ලබනුයේ පිරිමි අයදුම්කරුවන්ට පමණි.

5.5 වයස : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 (දහඅට)ට නොඅඩු අවුරුදු 45(හතලිස් පහ) ට නොවැඩි විය යුතුයි.

06. බඳවා ගැනීමේ ක්‍රමය : අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් හෝ පරීක්ෂණ මණ්ඩලයක් මගින් තනතුර සඳහා වෘත්තීය පරීක්ෂණයක් හා කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

එම වෘත්තීය පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය යන පරීක්ෂණ දෙකෙහිම ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල මත පවත්නා පුරප්පාඩු අනුව වඩු කාර්මික තනතුරට අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

6.1 වෘත්තීය පරීක්ෂණය :

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| විෂයානුබද්ධ වෘත්තීය පරීක්ෂණය - වඩු කාර්මික | පැය 1 1/2 | 100 | 60% |

6.1.1 විෂය නිර්දේශය : වඩු කර්මාන්තයට අදාළව පරීක්ෂකවරයා නම් කරන ලද භාණ්ඩයක්, අළුත්වැඩියාවක් හෝ කාර්යයක් සාර්ථකව නිම කිරීම.

6.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| පරීක්ෂා කර ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 50 | |
| 2. අතිරේක පළපුරුද්ද | 20 | |
| 3. අතිරේක වෘත්තීය සුදුසුකම් | 25 | |
| 4. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

සටහන : ඉහත වගුවෙහි සඳහන් ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍රයන් සඳහා වෙන්කර ඇති උපරිම ලකුණු ප්‍රමාණය ඇතුළත මවිසින් අනුමත කරනු ලබන විස්තරාත්මක ලකුණු පටිපාටියක් මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ඇත.

07. ව්‍යාජ තොරතුරු සැපයීම :

ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිර්ව්‍යාජ තොරතුරු සැපයිය යුතු ය. සාවද්‍ය තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් පරීක්ෂණයට පෙර හෝ පරීක්ෂණය පැවැත්වෙද් දී හෝ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක පත්වීම් බලධරයා විසින් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පුළුවන.

08. පත්වීමේ කොන්දේසි :

මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

09. සේවා කොන්දේසි :

I. පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වනු ඇත.

II. පත්වීම ලැබ වසර 03 ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු ය.

III. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරනු ලබන පොදු කොන්දේසි වලටද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක PSC/ EST/4/1/2/1/1//2012 හා 2014.03.24 දිනැතිව අනුමත කරන ලද වඩු කාර්මික බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධානයන්ට ද ඊට මින් මතු කරනු ලබන සංශෝධනයන්ට ද යටත්ව වඩු කාර්මික තනතුරට පත්වීම් ලබා දෙනු ලැබේ.

10. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම:

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2014.01.21 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව, සේවයට බඳවා ගනු ලබන සියළුම නිලධාරින් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.

11. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(i) *ඉල්ලුම්පත සැකසීම :*

මෙම නිවේදනයට අමුණා ඇති අයදුම්පත් ආකෘතියට අනුව අයදුම්පත සැකසිය යුතු ය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වේ.

සාමාන්‍ය ෆොටෝ කොපි (21 x 29cm/8.5"x12"/A4) කඩදාසියෙහි දෙපැත්තෙම භාවිතා කරමින් අයදුම්පත සකස් කළ යුතුය.

(ii) *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු. 2,40,360 ක් හෝ ඊට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය. රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් ආයතන ප්‍රධානියා විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

12. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියළු අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ සඳහන් පොදු නීති රීති සහ මෙම නිවේදනයේ අඩංගු කොන්දේසි අනුව කටයුතු කිරීමට බැඳී සිටී.

*සටහන* .—සම්මුඛ පරීක්ෂණයට හා වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් විදයම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

කල්‍යාණි දහනායක,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2015.08.31 දින,
දේශීය ආදයම් දෙපාර්තමේන්තුවේදී.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*දේශීය ආදයම් දෙපාර්තමේන්තුවේ වඩු කාර්මික නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2015*

01. (අ) මුලකුරු අගට යොද මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා. (GUNAWARDHANA. M. G. B.S. K.)

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. (අ) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
(ආ) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ඇ) ස්ථිර ලිපිනයට අදළ පොලිස් ස්ථානය :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐

ස්ත්‍රී - 1, පුරුෂ - 0 (අදළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

05. විවාහක/අවිවාහක බව : ☐
අවිවාහක - 1 (අදළ අංකය කොටුව තුළ ලියන්න)
විවාහක - 2

06. උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

07. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ (2015.10.19)

අවුරුදු ඃ ☐☐ මාස ඃ ☐☐ දින ඃ ☐☐

08. පුරවැසිභාවය (පරම්පරාවෙන් ද/ලියාපදිංචි කිරීමෙන් ද යන වග) :————.

09. දුරකථන අංකය ඃ ☐☐☐☐☐☐☐☐☐☐

10. අධ්‍යාපන සුදුසුකම් ඃ

10.1 අ. පො. ස. (සා. පෙළ.) පළමුවර

(i) විභාගයේ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාග ප්‍රතිඵල :

| විෂයය | ශ්‍රේණිය පළමුවර |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ. පො. ස. (සා. පෙළ.) දෙවැනිවර

(i) විභාගයේ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාග ප්‍රතිඵල :

| විෂයය | ශ්‍රේණිය දෙවැනිවර |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

10.2 අ. පො. ස. (උ. පෙළ.) පළමුවර

(i) විභාගයේ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාග ප්‍රතිඵල :

| විෂයය | ශ්‍රේණිය පළමුවර |
|---|---|
| | |
| | |
| | |
| | |

අ. පො. ස. (උ. පෙළ.) දෙවැනිවර

(i) විභාගයේ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාග ප්‍රතිඵල :

| විෂයය | ශ්‍රේණිය දෙවැනිවර |
|---|---|
| | |
| | |
| | |
| | |

11. වෘත්තීය සුදුසුකම් :

| | පාඨමාලාවේ නම | ආයතනය | කාලය | ලබා ඇති ප්‍රවීණතාවය |
|---|---|---|---|---|
| 1. | …………………… | …………………… | …………… | …………………… |
| 2. | …………………… | …………………… | …………… | …………………… |
| 3. | …………………… | …………………… | …………… | …………………… |

12. පළපුරුද්ද :

| | සේවය කරන ලද ආයතනය | තනතුර | සේවා කාලය |
|---|---|---|---|
| 1. | …………………… | …………………… | …………………… |
| 2. | …………………… | …………………… | …………………… |
| 3. | …………………… | …………………… | …………………… |

13. විනයානුකූල හේතුවක් මත රාජ්‍ය සේවයේ තනතුරකින් පහකර ඇත්නම් හෝ කිසියම් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියේ වරදකරු වී ඇත්නම් හෝ ඒ හා සම්බන්ධ සියළුම විස්තර :————.

14. අයදුම්කරුගේ සහතිකය ඃ

(i) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ නිවැරදි ලෙස සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ප්‍රකාශ කරමි.

(ii) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමටත් යටත් වන බව මම දනිමි.

(iii) අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීම් නිවේදනයේ සියළු කරුණු ඉතා හොඳින් කියවා අවබෝධ කරගත් බවත්, එහි සඳහන් සියළු කරුණු හා කොන්දේසිවලට එකඟවන බවත් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................... මයා./මිය./මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සහතික කරන්න)

16. දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ

...................................මයා./මිය./මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවයේ නියුතු බව ද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදයක බව ද, ඔහු/ඇය තනතුර සඳහා තෝරාගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද ප්‍රකාශ කරමි.

(අදාළ නොවන වචන කපා හරින්න.)

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සහතික කරන්න.)

09-304/2

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ඉඩම් අමාත්‍යාංශය

**නීති නිලධාරී (විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම**

ඉඩම් අමාත්‍යාංශයේ නීති නිලධාරී තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්‍ෂකයා පුරප්පාඩුව සඳහා බඳවාගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 6 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම් :*

(i) *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්* :
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) *පළපුරුද්ද* :
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසුව වසර තුනකට (03) නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(iii) *කායික සුදුසුකම්* :

සෑම අපේක්‍ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iv) *වෙනත් සුදුසුකම්* :
- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. නීති නිලධාරී III වැනි ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබාගත යුතු ය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදළ මට්ටමේ භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතු ය.

(iv) මෙම පත්වීම ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ කාර්ය පටිපාටික රීති හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත් වේ.

04. *වයස් සීමාව :-*
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

05. *වැටුප් පරිමාණය :-*
මෙම තනතුරට රු. 22,935 - 10 x 645 - 8 x 790- 17 x 1,050 - රු. 53,555 ක මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006හි අංක SL1- 2006A වැටුප් බණ්ඩය).

06. ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය සඳහා පහත සඳහන් ලකුණු දීමේ පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :** | | **20** |
| | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | |
| | - පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 20 | |
| | - දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 15 | |
| | - දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| | සටහන.-ගෞරව සමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 10 ලබාදිය යුතුයි. | | |
| | (උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දේ - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්) | | |
| 02. | **අතිරේක වෘත්තීය සුදුසුකම් :** | | **15** |
| | පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්) | | |

| | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| | පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්)<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්) | | |
| 03. | **අතිරේක පළපුරුද්ද :**<br><br>නීතිඥවරයකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද - මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02 එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30ක් (මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර)<br><br>(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයකුගේ හෝ ජනාධිපති නීතිඥවරයකුගේ හෝ විනිසුරුවරයකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය.) | | 30 |
| 04. | **තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම** | | 15 |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා | 15 | |
| | රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා | 10 | |
| | රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 06/පැය 720<br>- මාස 03/පැය 360 | <br><br>07<br>05 | |
| 05. | **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :** | | 15 |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/ උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය (අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය) | 15 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01ක් හෝ පැය 1500) | 10 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 06/පැය 720<br>- මාස 03/පැය 360 | <br><br>07<br>05 | |
| 06. | **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව :** | | **05** |
| | **මුළු එකතුව** | | **100** |

07. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයන් ලියාපදිංචිකිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,

08. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(අ) අයදුම්පත් 2015.10.19 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
ඉඩම් අමාත්‍යාංශය,
අංක 1200/6, මිහිකත මැඳුර,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

(ආ) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තෙහි සකස්කර මුල්පිටුව අංක 01 සිට 11 දක්වාත් දෙවැනි පිටුවෙහි ඉතිරිය ද වන ආකාරයෙන් පිළියෙල කළ යුතුය.

(ඇ) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ "ඉඩම් අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුර " යනුවෙන් සඳහන් කළ යුතු ය.

(ඈ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 22,935 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

(ඉ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩුව පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
ඉඩම් අමාත්‍යාංශය.

අංක 1200/6, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### *ආදර්ශ අයදුම්පත්‍රය*

*ඉඩම් අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම*

අංකය :————.
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

03. දුරකථන අංකය :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

06. උපන් දිනය : වර්ෂය :———. මාසය :———. දිනය :———.

07. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

වර්ෂ :———. මාස :———. දින :———.

08. නීති උපාධිය පිළිබඳ විස්තර :

විශ්වවිද්‍යාලය :————.

උපාධිය පිරිනැමූ දිනය :————.

භාෂා මාධ්‍ය :————.

09. නීතිඥයෙකු ලෙස දිවුරුම් දුන් දිනය :————.

10. නීතිඥයෙකු ලෙස වෘත්තීය පළපුරුද්ද : වසර ගණන :————.

11. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :————.

12. භාෂා ප්‍රවීණතාව : (අදාළ තීරුවේ හරි ( ✓ ) ලකුණ යොදන්න.)

| | ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍යයි | දුර්වලයි |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

13. *අයදුම්කරුගේ සහතිකය :*

..............................වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රාජ්‍ය සේවයෙන් පහ කර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත් තනතුර අතහැර ගිය අයකුසේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් සේවයට බඳවාගැනීමට නුසුදුස්සෙකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙහි අත්සන් කරන ලද ................................ හි පදිංචි .............. මයා/මිය/මෙය, මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහුගේ/ඇයගේ අත්සන ......... දින මා ඉදිරිපිට දී තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ,
නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

15. *රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

......................................... මහතා/මෙනවිය/මිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ .................... වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් නිලධාරියෙකු/නිලධාරිනියක වශයෙන් සේවයේ නියුතු බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.
(නිල මුද්‍රාව)

09-442

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II වැනි පන්තියේ "ආ" ඛණ්ඩයේ සහ II වැනි පන්තියේ "අ" ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අනුමත සේවා ව්‍යවස්ථාවට අනුකූලව යථෝක්ත විභාග, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2015 දෙසැම්බර් මස කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාග, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. මෙම නීති රීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවෙනවා ඇත.

(ii) අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති, *ගැසට් නිවේදනයේ* මුල වෙනම මුද්‍රණය කර ඇත.

03. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂක/අපේක්ෂිකාවන් ස්වකීය අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතු අතර, ඒ අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ රාජ්‍ය සේවයේ නිලධාරියෙකු නම්, තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු නම්, ඔවුන් සේවය කරන පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින් ද, 2015 ඔක්තෝබර් මස 19 වැනි දින නොඉක්මවා, විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත තම අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් විය යුතුය. අයදුම් පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. *හැඳුනුම්පත් :*

විභාග ශාලාවේ දී තමන් පෙනී සිටින එක් එක් විෂයය සඳහා ශාලාධිපති සෑහීමකට පත් වන ලෙස තම අනන්‍යතාව අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය,

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිලිවලින් එකක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

05. *අයදුම්පත්‍රය :*

(i) "ඒ4" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අංක 01 සිට 06 තෙක් පළමු වන පිටුවට ද, ඉතිරිය අනෙක් පිටුවලට ද, ඇතුළත් විය යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර පිළියෙල කර ගත හැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින් ම පිරිවිය යුතුය. අපේක්ෂක/ අපේක්ෂිකාවන් මෙම විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් අයදුම්පත පිරවිය යුතුය.

(ii) ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) පළමුවන වරට මෙම සම්පූර්ණ විභාගයට හෝ එක් විෂයකට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විභාගයට පෙනී සිටින්නේ නම් සම්පූර්ණ විභාගය සඳහා රු. 400 ක විභාග ගාස්තුවක් ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 200 විභාග ගාස්තුවක් ද, ගෙවිය යුතුය. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට හෝ ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මෙම ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරු වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර හේතුවක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

(iv) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවෙකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන ලද මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(v) එක් නිලධාරියෙකුට කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකට ම එකවර පෙනී සිටිය නොහැක.

(vi) අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II "ආ" ඛණ්ඩයට ඇතුළත්ව සිටින නිලධාරීන්ට II "ආ" ඛණ්ඩයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටිය හැක.

(vii) සේවයේ II "අ" ඛණ්ඩයේ නිලධාරීන්ට මෙන්ම අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට පස් වසරක සේවා කාලයක් සපුරා ඇති පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්වූ II වැනි පන්තියේ "ආ" ඛණ්ඩයේ නිලධාරීන්ට ද, II වැනි පන්තියේ "අ" ඛණ්ඩයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටිය හැක.

06. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදළ නම් ඊට අදළ ලදුපත සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, ඉල්ලුම් කරන විභාගය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ලදුපතේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීමද ප්‍රතිඵලදායී වනු ඇත.

07. ඉහත (06) වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

08. තමන් කැමති වන්නේ නම්, එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙන් වූ වාරවලදී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එතෙකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකින් අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

09. *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම* :

අංක 03 යටතේ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ප්‍රතිඵල අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ද, රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ද නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

10. *විභාග පරිපාටිය* :

(1) II වැනි පන්තියේ "ආ" ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02 න් සමන්විත වේ.

විෂයය අංකය (01) - කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය- (කාලය පැය 02 කි) ලකුණු 100 යි

විෂය අංකය (02) - මුදල් රෙගුලාසි (කාලය පැය 02 කි) ලකුණු 100 යි

***කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය - (විෂයය අංකය (01) විෂය නිර්දේශය***

මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ. :—

| | |
|---|---|
| II වන පරිච්ඡේදය | සේවයට බඳවා ගැනීමේ කාර්ය පරිපාටිය හා පත් කිරීම |
| III වන පරිච්ඡේදය | ස්ථාන මාරු කිරීම් |

| | |
|---|---|
| IV වන පරිච්ඡේදය | මාස්පඩි තාවකාලික තත්ත්වය, ස්ථිරත්වය සහ විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රදානය කිරීම. |
| V වන පරිච්ඡේදය | මුදා හැරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම හා සේවය අවසන් කිරීම |
| VIII වන පරිච්ඡේදය | අතිකාල දීමනා, නිවාඩු දවස් හා නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා |
| XII වන පරිච්ඡේදය | නිවාඩු |
| XIII වන පරිච්ඡේදය | දුම්රිය බලපත්‍ර |
| XIV වන පරිච්ඡේදය | දිවයින ඇතුළත රාජකාරි ගමන් |
| XIX වන පරිච්ඡේදය | රජයේ නිවාස |
| XLVII වන පරිච්ඡේදය | සාමාන්‍ය හැසිරීම හා විනය |

*මුදල් රෙගුලාසි (විෂය අංකය - 02) විෂය නිර්දේශය*

මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

(i) *I වන පරිච්ඡේදය*
වියදම් හා ආදායම් ඇස්තමේන්තු
ඒකාබද්ධ අරමුදල සහ වියදම් සැලසුම් කිරීම හා වැඩ සටහන්ගත කිරීම, වාර්ෂික වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේ ස්වරූපය, නව යෝජනා, වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ වගකීම, වියදම් ඇස්තමේන්තුවල වෙනස් කිරීම්
(මු. රෙ. 1සිට 68 දක්වා)

(ii) *III වන පරිච්ඡේදය*
මුල්‍ය කළමනාකරණය හා උත්තරදායි බව
ප්‍රධාන ගණක නිලධාරීන්, ගණක නිලධාරීන්, ආදායම් ගණුම් නිලධාරීන්, ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම (මු. රෙ. 124 සිට 147 දක්වා)

(2) II වන පන්තියේ "අ" ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් ප්‍රශ්නපත්‍ර 02 න් සමන්විත වේ.

විෂය අංකය (03) - කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය - (කාලය පැය 02 කි).
ලකුණු 100 යි.

විෂය අංකය (04) මුදල් රෙගුලාසි - (කාලය පැය 02 කි)
ලකුණු 100 යි.

*කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය (විෂය අංකය - 03) විෂය නිර්දේශය*

මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේදය මත සැකසේ.

| | | |
|---|---|---|
| XV වන පරිච්ඡේදය | - | අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යෑම. |
| XVI වන පරිච්ඡේදය | - | නිවාඩු ගමන් |
| XXIII වන පරිච්ඡේදය | - | ඇතැම් වර්ගවල ලෙඩ රෝගවලින් පෙළෙන රජයේ නිලධාරීන්ට විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි |
| XXIV වන පරිච්ඡේදය | - | වැටුප් ණය හා අත්තිකාරම් |
| XXV වන පරිච්ඡේදය | - | වෘත්තීය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහ |
| XXVII වන පරිච්ඡේදය | - | ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග |
| XXVIII වන පරිච්ඡේදය | - | පරිපාලන කාර්ය පරිපාටි හා විධි |
| XXX වන පරිච්ඡේදය | - | රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල |
| XXXIII වන පරිච්ඡේදය | - | නීති උපදෙස් හා නීති ක්‍රියා මාර්ග |
| XLVII වන පරිච්ඡේදය | - | සාමාන්‍ය හැසිරීම හා විනය |
| XLVIII වන පරිච්ඡේදය | - | විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති |

නිලධාරීන්ගේ කාර්ය සාධන හා ඇගයීම් පිළිබඳ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ වේ.

*මුදල් රෙගුලාසි (විෂය අංකය - 04) විෂය නිර්දේශය*

මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේදය මත සැකසේ.

(i) *VI වන පරිච්ඡේදය*
ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරිත්වය, අග්‍රිමය, හා බැංකු ගිණුම්, උප පත්‍රිකා, පොත්, මුදල්, මුද්දර යනාදිය පිළිබඳ සමීක්ෂණ මණ්ඩල, අග්‍රිම, බැංකු ගිණුම්
(මු. රෙ. 315 සිට 396 දක්වා)

(ii) *XIII වන පරිච්ඡේදය*
සැපයුම්, වැඩ හා සේවා
ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත්තු, සැපයුම්, භාණ්ඩවල භාරය සහ හරි වැරදි බැලීම, වැඩිමනත් භාණ්ඩ සහ පාවිච්චි කළ නොහැකි භාණ්ඩ
(මු. රෙ. 685 සිට 775 දක්වා)

11. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

12. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

13. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලත්වයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය නිරවද්‍ය ලෙස බල පැවැත්වෙන්නේය.

ජේ. දඩල්ලගේ,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ
අමාත්‍යාංශය.

2015 සැප්තැම්බර් මස 03 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II වන පන්තියේ "ආ" ඛණ්ඩයේ සහ II වන පන්තියේ "අ" ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015**

Efficiency Bar Examination Prescribed for Officers in Segment "B" and Segment "A" of class II of the Sri Lanka Technological Service - 2015

("ආ" ඛණ්ඩය සහ "අ" ඛණ්ඩය විභාග දෙක සඳහාම එකවර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ නොහැක)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

පෙනී සිටීමට බලාපොරොත්තු වන විභාගය :
II වන පන්තියේ 'ආ' ඛාණ්ඩය - 0
II වන පන්තියේ 'අ' ඛාණ්ඩය - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (අ) මුල'කුරු අගට යොදා මුල'කුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා : GUNAWARDHANA, M. G. B. S. K.

(ආ) සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ඇ) සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. රාජකාරි ලිපිනය (මෙම ලිපිනයට විභාග ප්‍රවේශපත්‍ර තැපැල් කරනු ලැබේ.)
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. ඉදිරිපත් වන විෂයය/විෂයයන් :

II වන පන්තියේ "ආ" ඛණ්ඩයේ/II වන පන්තියේ "අ" ඛණ්ඩයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ඉදිරිපත් වන විෂයන් (අදාළ නොවන වචන කපා හරින්න)

| *විෂයය* | *විෂය අංකය* |
|---|---|
| ………… | |
| ………… | |

06. ඔබ අයත් වන්නේ පළාත් රාජ්‍ය සේවයට ද, එසේ නොමැති නම් කුමන රාජ්‍ය සේවයට ද යන වග :
(ඔබ අයත් වන රාජ්‍ය සේවයට අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

(රාජ්‍ය සේවය - 10 /බස්නාහිර පළාත් රාජ්‍ය සේවය - 01/මධ්‍යම පළාත් රාජ්‍ය සේවය - 02/දකුණු පළාත් රාජ්‍ය සේවය - 03/උතුරු පළාත් රාජ්‍ය සේවය - 04/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවය - 05/වයඹ පළාත් රාජ්‍ය සේවය- 06/ උතුරුමැද පළාත් රාජ්‍ය සේවය -07/ඌව පළාත් රාජ්‍ය සේවය - 08/සබරගමුව පළාත් රාජ්‍ය සේවය - 09)

07. දුරකථන අංකය :

08. (i) උපන් දිනය : වර්ෂය මාසය දිනය

(ii) 2015.10.19 දිනට වයස අවු. මාස දින

09. (i) පදවි නාමය :——————.

(ii) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පන්තිය හා ශ්‍රේණිය :——————.

……………… (II අ/II ආ වශයෙන් ඇතුළත් විය යුතුය.)

(iii) 2015.10.19 වන දිනට එම ශ්‍රේණියේ සේවා කාලය :——————.

10. ඔබ අයත්වන දෙපාර්තමේන්තුව :——————.

11.

| |
|---|
| මුදල් ගෙවූ ලදුපත මෙහි අලවන්න. (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත) |

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට යටත් වන බව ද ප්‍රකාශ කරමි.

——————,
අපේක්ෂකයා/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :——————.

***සටහන.***—තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු හෝ තමාගේ ප්‍රාදේශීය ප්‍රධානියාගේ ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

*අත්සන සහතික කිරීම*

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන …………………… මහතා/ මහත්මිය/ මෙනෙවිය ..………… දින මා ඉදිරිපිටදී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, සහතික කරමි.

——————,
අත්සන සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත අංක 01 සිට 11 තෙක් ඡේදවල අඩංගු තොරතුරු නිවැරදි බවත් මෙම අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

——————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

දිනය :————.

09-445

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2015 සැප්තැම්බර්

2014.10.11 වැනි දින හා අංක 1883/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් **II ශ්‍රේණියට උසස් කිරීමට පෙර**, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් ස්ථිර කිරීමට පෙර හා මෙම දෙපාර්තමේන්තු විභාගය සම්පූර්ණ නොකරන ලද වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියේ තනතුරක නිලධාරියකු එකී පත්වීම් දින සිට **දෙවසරක කාලයක්** ඇතුළත සමත් විය යුතු වන දෙපාර්තමේන්තු විභාගය 2015.10.25 වන දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා කාල සටහන ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02. *සුදුසුකම්* :

අදළ විභාගය සම්පූර්ණ කර නොමැති, ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්ට සහ පත්වීම ස්ථිර නොකරන ලද දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ට මෙම විභාගයට අයදුම් කළ හැක. තවද, මෙම දෙපාර්තමේන්තු විභාගය සම්පූර්ණ නොකරන ලද වෛද්‍ය නිලධාරීන් පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියේ තනතුරකට පත්කර ඇත්නම් එම නිලධාරීන්ටද මෙම විභාගයට අයදුම් කළ හැක.

03. *අයදුම්පත්* :

මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා වෙත 2015.09.20 වැනි දින හෝ ඊට ප්‍රථම භාර දිය යුතුය. සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ බවට ආයතන ප්‍රධානීන් විසින් සහතික කරන ලද අයදුම්පත් කොළඹ 10, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, සෞඛ්‍ය අමාත්‍යාංශයේ "සුවසිරිපාය" ගොඩනැගිල්ලේ අධ්‍යක්ෂ (විභාග) වෙත 2015 සැප්තැම්බර් මස 25 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතු ය. සෑම අයදුම්පත්‍රයකම දක්වා ඇති **තොරතුරු නිවැරදි බව කොට්ඨාස ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය.** තම අයදුම්පත සමග ලිපිනය ලියන ලද රු. 35.00ක් වටිනා මුද්දර ඇල වූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක්ද එවිය යුතු ය. (මෙහි කැමති පරිදි රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලිවිය හැකිය). ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැ. යු .*— ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය A4 වර්ගයේ කඩදාසියක පළමු පිටුවේ අංක 1 සිට 4 (ඉ) දක්වාත්, දෙවන පිටුවේ අංක 4 (ඊ) සිට අංක 8 දක්වාත් සකස් කළ යුතු ය. ඉහත ආකෘතියට අනුකූල නොවන සහ අසම්පූර්ණ සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. *විභාග ගාස්තු* :

(i) විභාගයට පළමුවන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25 බැගින් අවලංගු නොකළ මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන සහ දිනය යොදා ඒවා නිසිලෙස අවලංගු කළ යුතු ය.

(ii) කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. *විභාගයට ඇතුළත් කර ගැනීම* :

(i) පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයින්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ii) විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළ දී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතු ය.

(අ) ජාතික හැඳුනුම්පත්‍රය;
(ආ) දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත්‍රය;
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය;
(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(iii) කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් මත විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත් නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පරීක්ෂාකර මධ්‍යස්ථානය සහ විභාග අංකය සොයාගත හැකි ය. එසේ ඔබේ නමට අදාළ විභාග අංකය හා විභාග මධ්‍යස්ථානය සොයා ගත්තේ නම් ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධාරියා වෙතින් අත්සන සහතික කරන ලද ලිපියක් ද සමග වෙබ් අඩවියේ සඳහන්ව තිබූ විභාග මධ්‍යස්ථානයට පැමිණ ඔබේ අනන්‍යතාවය තහවුරු කර විභාගයට පෙනී සිටිය හැකි ය. ප්‍රවේශ පත්‍ර ලැබුණු අයදුම්කරුවන් අත්සන සහතික කර රැගෙන පැමිණිය යුතු ය. අත්සන සහතික කරන ලද ලිපිය හෝ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්හට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(වෙබ් අඩවිය-www. health. gov.lk)

06. *විභාග පරිපාටිය* :

මෙම විභාගය ලිඛිත රචනා ප්‍රශ්න පත්‍ර තුනක් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයක් වශයෙන් කොටස් හතරකින් සමන්විත ය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත් වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50 ක් ලබා ගත යුතු ය. එක් වරක දී හෝ කිහිපවරක දී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකි ය. නිලධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ දී අදාළ සියලුම විෂයන්ට පෙනී සිටිය යුතු ය.

07. *විභාග විෂය නිර්දේශ මාලාව* :

07.1 ලිඛිත විභාගය :

07.1.1 ආයතන සංග්‍රහය :
කාලය පැය 02 යි, ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතු ය.

*විෂය නිර්දේශය* :

(i) සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පොදු රෙගුලාසි,

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති හා රෙගුලාසි.

(iii) ආයතන සංග්‍රහය

I කොටස — VI, VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XXIII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXI, XXXII, පරිච්ඡේදයන්;

II කොටස — XLVII සහ XLVIII වැනි පරිච්ඡේදයන්;

07:1:2 *රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය* :
කාලය පැය 1 1/2 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

*විෂය නිර්දේශය* :

සෞඛ්‍ය සේවා සංග්‍රහය
(i) රෝහල් හා මහජන සෞඛ්‍ය පරිපාලනය
(ii) රසායනාගාර සේවා කළමණාකරනය
(iii) ඖෂධ කළමණාකරනය

07:1:3 *ගිණුම්* :

කාලය පැය 02 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

විෂයය නිර්දේශය :

(i) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තොග කළමනාකරණය හා ගිණුම්කරණ රෙගුලාසි
(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලැබූ කළමනාකරන අත් පොතෙහි මූල්‍ය කොටස
(iii) වෛද්‍ය නිලධාරීන් සඳහා දෛනික පරිපාලන රාජකාරි සඳහා අදාළවන රාජ්‍ය මූල්‍ය රෙගුලාසි.

| | |
|---|---|
| පරිච්ඡේද I | - මු. රෙ. 1, 2, 78 |
| පරිච්ඡේද II | - මු. රෙ 90, 91, 101,102, 103, 104, 105, 106, 107, 108, 109, 110, 113, 115, 118, 119 |
| පරිච්ඡේද III | - මු. රෙ 124, 125, 126, 127, 128, 131, 133, 134, 135, 136, 137, 138, 139, 140, 142, 143, 151, 152, 154, 155,156, 189 |
| පරිච්ඡේද V | - මු.රෙ 200, 201, 215, 225, 238, 245, 255, 257, 260 |
| පරිච්ඡේද VI | - මු. රෙ 380, 381, 382, 383, 384, 385, 386, 388, 389, 390, 391, 392, 393, 394 |
| පරිච්ඡේද VII | - මු. රෙ 488, 493 |
| පරිච්ඡේද XIII | - මු. රෙ 715, 716, 756, 757, 758 |

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය
1 වැනි පරිච්ඡේදය - සියලුම වගන්ති.
2 වැනි පරිච්ඡේදය - 2.3, 2.4, 2.5, 2.6, 2.7, 2.8
3 වැනි පරිච්ඡේදය - 3.1, 3.2, 3.3, 3.4, 3.5, 3.6, 3.7, 3.8, 3.9

07:2 සිංහල/දෙමළ වාචික පරීක්ෂණය :
සිංහල/දෙමළ භාෂා ප්‍රවීනතාවය මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙන යාමේදී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහල මාධ්‍ය නිලධාරීන්ට දෙමළ මාධ්‍යයෙන්ද, දෙමළ මාධ්‍ය නිලධාරීන්ට සිංහල මාධ්‍යයෙන්ද සන්නිවේදනය කිරීමට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ. කාලය විනාඩි 10කි.

08. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ කොට්ඨාසයේ/විශේෂිත ව්‍යාපාරයේ/ආයතනයේ සේවයෙහි නියුතු අදාල නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න.

මෙම තොරතුරු www.health. gov.lk වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත.

*සැ. යු.*—විභාග නිවේදනයේ දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තනයන් අතර යම් ව්‍යාකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බල පැවැත් වේ.

එම්. බී. එල්. රහුමාන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන II,)
ලේකම් (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය) වෙනුවට.

2015 සැප්තැම්බර් මස 03 වැනි දින.
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම්පත

*ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2015 සැප්තැම්බර්*

(01) (*අ*) (i) අයදුම්කරුගේ නම (සිංහලෙන් හෝ දෙමළෙන් මුලකුරු අගට යොදා ලියන්න) :——————————.

(ii) අයදුම්කරුගේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින් මුලකුරු අගට යොදා ලියන්න) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන් හෝ දෙමළෙන්) :——————————.

(iv) මුලකුරු වලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(*ආ*)(i) නිළ නාමය (අදාළ කොටුව තුල (✓) ලකුණ යොදන්න.

I වෛද්‍ය නිලධාරී : ☐ II දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී : ☐

(ii) සීමාවාසික පත්වීම ලද දිනය :——————————.

(iii) ප්‍රාථමික ශ්‍රේණියට / II ශ්‍රේණියට පත්වීම ලද දිනය :——————————.

02. ඔබ මෙවර විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයන් ඉදිරියේ ඇති කොටුව තුළ (✓) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය : ☐ ආයතන සංග්‍රහය : ☐ ගිණුම් : ☐

සිංහල වාචික : ☐ දෙමළ වාචික : ☐

03. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (අදාළ කොටුව තුළ (✓) ලකුණ යොදන්න.)

සිංහල : ☐ ඉංග්‍රීසි : ☐ දෙමළ : ☐

04. (අ) දැන් සේවය කරන ආයතනය (පැහැදිලිව සඳහන් කරන්න) :————.

(ආ) එය අයත් දිස්ත්‍රික්කය :————.

(ඇ) දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

(ඈ) හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

(ඉ) පහත දක්වා ඇති මධ්‍යස්ථාන අතුරින් විභාගයට පෙනී සිටීමට කැමැති විභාග මධ්‍යස්ථානයට අදාල කොටුවේ (✓) හරි ලකුණ යොදන්න. (දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් හෝ දක්වා ඇති මධ්‍යස්ථාන එකක් හෝ කිහිපයක් අවලංගු කරනු ලබන අතර, එකී මධ්‍යස්ථානයට අයදුම්කරනු ලැබූ අයදුම්කරුවන් ආසන්නතම විභාග මධ්‍යස්ථානයට හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරනු ලබන වෙනත් විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ.)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | ☐ | කඳාන | ☐ | හම්බන්තොට | ☐ | අම්පාර | ☐ |
| කළුතර | ☐ | ගාල්ල | ☐ | බදුල්ල | ☐ | වව්නියාව | ☐ |
| කුරුණෑගල | ☐ | අනුරාධපුර | ☐ | රත්නපුර | ☐ | | |
| මහනුවර | ☐ | මඩකලපුව | ☐ | යාපනය | ☐ | | |

(ඊ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" x 4" ප්‍රමාණයේ රුපියල් 35 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේ ද? :————.

(උ) (i) තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.

(ii) තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේ ද ? :————.

(ආ) එසේ පෙනී සිට ඇත්නම් මෙවර වෙනුවෙන් මුද්දර අලවා තිබේද? :————.

| මුද්දර කොටුව |
|---|

(මුද්දර අලවා ඒ මත අත්සන තබන්න.)

06. අයදුම්කරුගේ සහතිකය :

මගේ දැනුම හා විශ්වාසය පරිදි —

(i) මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් ප්‍රථම වතාවට නොවන බැවින් රු......... ක් වටිනා මුද්දර අලවා ඇති බවත් මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියාකිරීමටත් මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මාගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟවන බවත් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

07. *ආයතන ප්‍රධානියාගේ සහතිකය* :

................................ මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු වන අතර, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට වන/නොවන බවටද රු................ ක් වටිනා මුද්දර මෙම මුද්දර ඉල්ලුම් පත්‍රයට අලවා ඇති බවද/මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

08. *විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය* :

........................ මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු වශයෙන් මගේ කොට්ඨාසයේ/ව්‍යාපාරයේ සේවය කරන බවත්, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

————,
විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත
ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය).

දිනය :————.

(අනවශ්‍ය කොටස් කපා හරින්න.)

09-482

---

## සංශෝධනයයි

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2013 (2014)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1929 හා 2015.08.21 දිනැති *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2013 (2014) *ගැසට්* නිවේදනය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

I. 6.1.3 (ආ) ඡේදය - ''අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර උපරිම වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම් සපුරාලනුයේ

අයදුම්කරුගේ උපන්දිනය 1993.09.21 දින හෝ ඊට පෙර හා 1980.09.21 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.''

II. 9.3 ඡේදය - ''ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කිරීම අවශ්‍ය වේ. අයදුම්පත් 2015.10.05 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන සහ විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ, ''ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයට බඳවා ගැනීම සඳහා වූ විවෘත/සීමිත තරග විභාගය - 2013 (2014)'' යන්න සඳහන් කර තිබිය යුතුය.''

ලේකම්,
කෘෂිකර්ම අමාත්‍යාංශය.

2015 සැප්තැම්බර් මස 04 වැනි දින
රජමල්වත්ත පටුමග
බත්තරමුල්ල.

09-447

## සංශෝධනයයි

### සෞඛ්‍ය හා දේශීය අමාත්‍යාංශය

''ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරී බණ්ඩ - 02 සේවා ගණයේ (MN 05-2006ඒ) හෘද පෙනහළු නිවේශක II වන ශ්‍රේණියේ තනතුරු සඳහා විවෘත හා සීමිත පදනම මත බඳවා ගැනීම''

(උක්ත ශීර්ෂයෙන් 2015.08.14 දිනැති, අංක 1928 දරන රජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ *ගැසට්* නිවේදනයට වැඩිමනත් වශයෙනි.)

හෘද පෙනහළු නිවේශක තනතුර හෙද සේවයේ උසස් වීමක් නොවන බවත් ඒ අනුව හෘද පෙනහළු නිවේශක තනතුර නව බඳවා ගැනීමක් වන බවද සැලකිය යුතුය.

තවද එම *ගැසට් පත්‍රයට* අනුව අයදුම් පත් භාරගන්නා අවසාන දිනය 2015.09.11 ලෙස සඳහන් වන අතර එම දිනය 2015.09.25 ලෙස සංශෝධනය විය යුතු බවද කාරුණිකව දන්වා සිටිමි.

ආචාර්ය. ඩී. එම්. ආර්. බී. දිසානායක,
ලේකම්,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

09-399

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.